*සැ. යු.*– 2007.05.25 වැනි දින අංක 1,499 දරන *ගැසට් පත්‍රයෙහි* IV(අ) කොටස පළ නොකරන ලදී.

මෙවර පළවන *ගැසට් පත්‍රයේ* **V** කොටසේ 2002 වර්ෂයේ මුද්‍රිත පොත් නාමාවලියේ අප්‍රේල්- ජුනි කාර්තුව ඉංග්‍රීසි භාෂාවෙන් පළ වේ.



# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,500 - 2007 ජුනි 01 වැනි සිකුරාදා - 2007.06.01**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)



| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | 526 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... .. | 528 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | 527 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් .. ... ... | 528 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | 394 | විවිධ දැන්වීම් ... ... ... | — |



**(i)** *සැ. යු.*– ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත් කෙටුම්පත 2007 මැයි මස 04 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* **II** වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**(ii)** කොරියන් - ලංකා ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2007 මාර්තු මස 30 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* **II** වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 ජුනි මස 08 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 මැයි මස 25 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

ශ්‍රී ලංකා දුම්රිය සේවයට ට්‍රැක් මෝටර් කාර් 2 ක් (ක්‍රේන් සහ පවර් වින්ච් සහිත එකක් සහ අනෙක බැකෝ සහ පවර් වින්ච් සහිතව) සහ ට්‍රොලි 11 ක් සැපයීම සඳහා වූ ටෙන්ඩරය - ටෙන්ඩර් අංක - එස් ආර් එස්/එෆ්. 6592

ශ්‍රී ලංකා දුම්රිය සේවයට ට්‍රැක් මෝටර් කාර් 2ක් (ක්‍රේන් සහ පවර් වින්ච් සහිත එකක් සහ අනෙක බැකෝ සහ පවර් වින්ච් සහිතව සහ ට්‍රොලි 11ක් සැපයීම සඳහා ශ්‍රී ලංකාව, කොළඹ 10 මාවතේ, අංක 1 හි පිහිටි ප්‍රවාහන අමාත්‍යාංශයේ, අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත්, නිෂ්පාදකයින්ගෙන් හා / හෝ සැපයුම්කරුවන්ගෙන් භාරගනු ලබයි. නිෂ්පාදකයින්ට, ඔවුන්ගේ මිල ගණන් ඔවුන් විසින් නීතියෙන් ඇටෝර්නි බලය පවරන ලද ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි නියෝජිතයෙකු මාර්ගයෙන් හෝ කෙළින්ම ඉදිරිපත් කළ හැක.

02. ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවත, දරන ලිපිනයේ පිහිටි දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් හෝ විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල කාර්යාලවලින් 2007.04.26 දින සිට 2007.06.26 දින දක්වා සතියේ වැඩ කරන දිනවල දී 9.30 පැයේ (හෝරාවේ) සිට 15.30 පැය (හෝරාව) දක්වා (ශ්‍රී ලංකා වේලාවෙන්) ආපසු නොගෙවනු ලබන රු. 5,000 ක ටෙන්ඩර් ගාස්තු මුදලක් හෝ විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල කාර්යාල මගින් තීරණය කරනු ලබන ඒ සමාන පරිවර්තිත විදේශ මුදල් ප්‍රමාණයක් ගෙවා ලබාගන්නා ලද ටෙන්ඩර් ආකෘති මත ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

03. මෙම ක්‍රේන්/බැකෝ සහ පවර් වින්ච් සහිත ට්‍රැක් මෝටර් කාර් සහ ට්‍රොලි නිෂ්පාදකයින්ට ISO 9001:2000 තත්ත්ව පාලන සහතිකය හෝ ඒ හා සමාන පිළිගත හැකි ජාත්‍යන්තර තත්ත්ව පාලන ප්‍රමිතීන්ට අනුකූල සහතික තිබිය යුතුය.

04. ටෙන්ඩර්පත් භාරගන්නා අවසාන දිනය 2007.06.27 දින 14.00 පැයට (ශ්‍රී ලංකා වේලාවෙන්) වේ. මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ අතින් ගෙනවිත් භාරදීම හෝ කළ හැකිය :

සභාපති,
අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රවාහන අමාත්‍යාංශ ලේකම්තුමා බාරේ,
අංක 1, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10, ශ්‍රී ලංකාව.

ලියාපදිංචි තැපෑලේ දී සිදුවන ප්‍රමාදයන්ට ප්‍රවාහන අමාත්‍යාංශය හෝ දුම්රිය දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

05. 2007.06.06 දින පැය 10.00 ට කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවතේ, අංක 1 හි පිහිටි ප්‍රවාහන අමාත්‍යාංශ කාර්යාලයේ පැවැත්වෙන පූර්ව ටෙන්ඩර් මණ්ඩල සාකච්ඡාවේ දී පැහැදිලි කර ගැනීම් සහ තොරතුරු ලබාගත හැක. ටෙන්ඩර්කරුවන් මෙම සාකච්ඡාවට පෙර ටෙන්ඩර් පත් ලබාගත යුතුය.

06. ටෙන්ඩර්පත් විවෘත කිරීම, ටෙන්ඩර්පත් භාරගැනීම අවසන් වූ විගස ඡේද අංක 4 හි සඳහන් ස්ථානයේ දී සිදුකෙරේ. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවට ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයාට සහභාගිවීමට අවසර දෙනු ලැබේ.

07. ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කට් මාවතේ පිහිටි දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී ටෙන්ඩර්පත් අය කිරීමකින් තොරව පරීක්ෂා කළ හැකිය.

08. වැඩි විස්තර සඳහා, දුම්රිය ගබඩා අධිකාරී, දුම්රිය ගබඩා උප දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1347, ඕල්කට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.

දුරකථන අංක: 94(011)2432044 හෝ 94(011) 2436818 අමතන්න.

ෆැක්ස් : 94(011) 2432044 ඊ-මේල් : srs@sierra.lk

සභාපති,
අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව.

06-01

---

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

ශ්‍රී ලංකා දුම්රිය සේවයේ කොළඹ අංගනයට ගැල් නඩත්තු කිරීමේ කටයුතු සඳහා පිහිටුවීමට නියමිත වැඩපොළට අවශ්‍ය සින්ක්‍රොනයිස් ස්කෘ ජැක්ස් කට්ටලයක්
(One Set of Synchronized Screw Jacks in order to provide New Workshop Facility for Wagon Maintenance at Colombo Yard)
සැපයීම සඳහා වූ ටෙන්ඩරය - ටෙන්ඩර් අංක එස්. ආර්. එස්./එෆ් 6539

ශ්‍රී ලංකා දුම්රිය සේවයේ කොළඹ අංගනයට ගැල් නඩත්තු කිරීමේ කටයුතු සඳහා පිහිටුවීමට නියමිත වැඩපොළට අවශ්‍ය සින්ක්‍රොනයිස් ස්කෘ ජැක්ස් කට්ටලයක් සැපයීම සඳහා කොළඹ, තැ. පෙ. 355, දුම්රිය මූලස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත්, නිෂ්පාදකයින්ගෙන් හා /හෝ සැපයුම්කරුවන්ගෙන් භාරගනු ලබයි. නිෂ්පාදකයින්ට, ඔවුන්ගේ මිල ගණන් ඔවුන් විසින් ඇටෝර්නි බලය පවරන ලද නියෝජිතයෙකු මාර්ගයෙන් ද ඉදිරිපත් කළ හැක.

02. ටෙන්ඩර්පත් භාරගන්නා අවසාන දිනය 2007.06.28 දින ප. ව. 2.00 (ශ්‍රී ලංකා වේලාවෙන් ) වේ.

03. ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවතේ පිහිටි දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලය වෙත හෝ පිටරටවල පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාල වෙත 2007.06.26 දින ප.ව. 3.00 ( ශ්‍රී ලංකා වේලාවෙන් ) තෙක් ආපසු නොගෙවනු ලබන රු. 2,500 ක ටෙන්ඩර් ගාස්තු මුදලක් ගෙවා ලබාගන්නා ලද ආකෘති මත ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

04. ටෙන්ඩර්පත් භාරගැනීම අවසන් වූ විගස ශ්‍රී ලංකාව, කොළඹ 10 හි පිහිටි දුම්රිය මූලස්ථානයේ දී විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවට ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයාට සහභාගීවීමට අවසර දෙනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනවිත් භාරදීම හෝ කළ හැකිය.

සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය, දුම්රිය මූලස්ථානය,
කොළඹ 10, ශ්‍රී ලංකාව.

06. ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවතේ පිහිටි දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී ටෙන්ඩර් පත් අයකිරීමකින් තොරව පරීක්ෂා කළ හැක.

*වැඩි විස්තර සඳහා* : දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1347, ඕල්කොට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.

දුරකථන අංක : 94(11)2432044 හෝ 94(11)2436818.

යොමු අංකය : එස්.ආර්.එස්. /එෆ්.6539.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව.

06 – 02

---

# බඩු බාහිරාදිය විකිණීම්

## මහෙස්ත්‍රාත් අධිකරණය - කන්තලේ

### හිමිකම් නොකියන ලද හා රාජසන්තක කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කන්තලේ මහෙස්ත්‍රාත් අධිකරණයේ මෙතෙක් හිමිකම් නොකියන ලද හා රාජසන්තක කරන ලද පහත සඳහන් භාණ්ඩ 2007 ක් වූ ජූනි මස 23 වැනි දින පෙරවරු 9.00ට අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසිය පවත්වන දින පැය භාගයකට කලින් අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකිය.

භාණ්ඩ වෙන්දේසි කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවන්හි දී අධිකරණයේ අභිමතය පරිදි භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

සියළුම භාණ්ඩ මුදල් ගෙවා එදිනම අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය.

සියළුම ගෙවීම් මුදලින් කළ යුතු අතර, චෙක්පත් භාරගනු නොලැබේ. හැඳුනුම්පත් රැගෙන ඒම අනිවාර්ය වේ.

මෙම උපලේඛනයේ සඳහන් භාණ්ඩ හෝ කිසියම් භාණ්ඩයක හිමිකම් පාන්නකු ඇත්නම්, වෙන්දේසියට නියමිත දිනට පෙර තම හිමිකම් ඉදිරිපත් කළ යුතුය. පසුව කරන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

ඒ. එම්. ඩී. එස්. දික්කාපිටිය,
මහෙස්ත්‍රාත්/අතිරේක දිසා විනිසුරු,
කන්තලේ.

2007 මැයි මස 08 වැනි දින,
කන්තලේ මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| *අනු අංකය* | *නඩු අංකය* | *වර්ගය* | *ප්‍රමාණය* |
|---|---|---|---|
| 01 | එම්සී 28444 | අංක 55575276 පාපැදිය | 01 |
| 02 | එම්සී 28440 | අංක එස්ආර් 02083 පාපැදිය | 01 |
| 03 | එම්සී 28438 | අංක 55967781 පාපැදිය | 01 |
| 04 | එම්සී 28445 | අංක 68229803 පාපැදිය | 01 |
| 05 | - | අංක 45767409 පාපැදිය | 01 |
| 06 | - | අංක 510327 පාපැදිය | 01 |
| 07 | - | අංක එස් 3638253 පාපැදිය | 01 |
| 08 | - | අංක 27142 පාපැදිය | 01 |
| 09 | - | අංක එස් 2බී22897 පාපැදිය | 01 |
| 10 | - | අංක 24)1)1) පාපැදිය | 01 |
| 11 | - | අංක සීසී 187 පාපැදිය | 01 |
| 12 | - | අංක 420354 පාපැදිය | 01 |
| 13 | එම්සී 875/04 කරත්ත | | 01 |
| 14 | එම්සී 1474/04 කරත්ත | | 01 |
| 15 | එම්සී 2036/05 කරත්ත | | 01 |
| 16 | එම්සී 3474/05 කරත්ත | | 01 |
| 17 | එම්සී 626/04 කරත්ත | | 01 |
| 18 | එම්සී 1782/02 කරත්ත | | 01 |
| 19 | එම්සී 874/04 කරත්ත | | 01 |
| 20 | එම්සී 3443/04 කරත්ත | | 01 |
| 21 | එම්සී 9193/02 කරත්ත | | 01 |
| 22 | එම්සී 27745 කරත්ත | | 01 |
| 23 | එම්සී 3839/04 කරත්ත | | 01 |
| 24 | එම්සී 3425/05 කරත්ත | | 01 |
| 25 | එම්සී 2110/04 කරත්ත | | 01 |
| 26 | එම්සී 1417/04 කරත්ත | | 01 |
| 27 | එම්සී 3938/04 කරත්ත | | 01 |
| 28 | එම්සී 5552/04 කරත්ත | | 01 |
| 29 | එම්සී 5147/04 කරත්ත | | 01 |

| අනු අංකය | නඩු අංකය | වර්ගය | ප්‍රමාණය |
|---|---|---|---|
| 30 | එම්සී 5002/04 | කරත්ත | 01 |
| 31 | එම්සී 1025/02 | කරත්ත | 01 |
| 32 | එම්සී 1214/03 | කරත්ත | 01 |
| 33 | එම්සී 1815/03 | කරත්ත | 01 |
| 34 | එම්සී 5174/04 | කරත්ත | 01 |
| 35 | එම්සී 1240/04 | කරත්ත | 01 |
| 36 | එම්සී 4439/05 | කරත්ත | 01 |
| 37 | එම්සී 1203/04 | කරත්ත | 01 |
| 38 | එම්සී 28111 | සවල් | 01 |
| 39 | එම්සී 28071 | සවල් | 01 |
| 40 | එම්සී 28779 | සවල් | 02 |
| 41 | එම්සී 28109 | සවල් | 01 |
| 42 | එම්සී 28336 | සවල් | 01 |
| 43 | එම්සී 28365 | සවල් | 01 |
| 44 | එම්සී 28077 | සවල් | 01 |
| 45 | එම්සී 28474 | සවල් | 01 |
| 46 | එම්සී 28479 | සවල් | 01 |
| 47 | එම්සී 28475 | සවල් | 01 |
| 48 | එම්සී 28631 | සවල් | 02 |
| 49 | එම්සී 27814 | සවල් | 01 |
| 50 | එම්සී 28075 | සවල් | 01 |
| 51 | එම්සී 28107 | උදළු | 01 |
| 52 | එම්සී 28479 | උදළු | 01 |
| 53 | එම්සී 28440 | පොරව | 01 |
| 54 | එම්සී 28441 | පොරව | 01 |
| 55 | එම්සී 4829/04 | පොරව | 01 |
| 56 | එම්සී 28438 | පොරව | 01 |
| 57 | එම්සී 28444 | පොරව | 01 |
| 58 | එම්සී 28439 | පොරව | 01 |
| 59 | එම්සී 28445 | පොරව | 01 |
| 60 | එම්සී 2922/05 | පොරව | 01 |
| 61 | එම්සී 28876 | බැරල් | 01 |
| 62 | එම්සී 28871 | බැරල් | 01 |
| 63 | එම්සී 28872 | බැරල් | 01 |

06-03

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙර කරනු ලබන දැන්වීම

අංක 143/10, එදිරිසිංහ මාවත, කිතුලම්පිටිය, උළුවිටිකෙ යන ලිපිනයේ පදිංචි මිථිලා කුමාරි රත්නායක වන මා, ගාල්ල දිස්ත්‍රික් මහාධිකරණ කලාපයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු ලෙස ඇතුළත් වීම සඳහා නොතාරිස් ආඥාපනතේ 107 අධිකාරියේ 07 වන වගන්තිය ප්‍රකාර මෙදින දින සිට මසක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව මෙයින් සියලු දෙනා වෙත දැනුම් දෙනු ලැබේ.

මෙයට විශ්වාසී
මිථිලා කුමාරි රත්නායක.

2006 ඔක්තෝබර් මස 03 වැනි දින.

06-117

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව – ප්‍රධාන කාර්යාලය

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියා සහතික කරන ලද්දාවූ ද 2005.09.26 වැනි දින සහ අංක 2538 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සමගි සර්විසස් ඇන්ඩ් ඉන්වෙස්මන්ට් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය ණයකරු හැටියට පැහැරහැර ඇති හෙයින්, සීමාසහිත හැටන් නැෂනල් බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියළු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2007 ජුනි මස 18 වැනි දින පෙ. ව. 11.00 ට ඇරඹෙන පරිදි දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, උතුරු පිටිගල් කෝරළේ අනයිවි ලුන්දන් පත්තුවේ ආරච්චි කට්ටුව ප්‍රාදේශීය හා සීමාව තුළ ආරච්චිකට්ටුව ගමේ පිහිටි "තිඹිරිගහවත්ත " නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක එම්. ඩබ්. එල්. ජේ. ජේ. පීරිස් විසින් 1997.07.07 වැනි දින මැන සාදන ලද අංක 1007 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 2, ලොට් 3 හා ලොට් 4 දරන ඉඩම් කොටස් හා ඒ තුළ පිහිටි ගොඩනැගිලි හා සියලු දේත් සමග වේ.

*විශාලත්වය* : ලොට් 2 රූඩ් 1 පර්චස් 35
ලොට් 3 රූඩ් 1 පර්චස් 35
ලොට් 4 රූඩ් 1 පර්චස් 35

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2007.03.23 දින දරන රජයේ *ගැසට් පත්‍රය* හා 2007.04.10 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය :

1. ගැණුම් මුදලින් සියයට දහය (10%)ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%)ක් ද,
4. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සියය (රු. 500)ක් ද,
5. සියලුම ප්‍රචාරක වියදම්,
6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහ (රු. 2,000)ක් ද, වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතුය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති 10%ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ප්‍රධාන කළමණාකරු (ණය අයකිරීම්), සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10, දුරකථන අංක 2661815, 2661816 ගෙන් ලබාගත හැක.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු,
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම බිල්ඩිං,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.
දුරකථන අංක : 2863121.

06-115

---

## සීමාසහිත නේෂන්ස් ට්‍රස්ට් බැංකුව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කරනු ලබන විකිණීම

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, රාගම්පත්තු අලුත්කුරු කෝරළේ, වැලිගම්පිටියේ පිහිටි බලයලත් මිතින්දෝරු අයි. එම්. සී. ප්‍රනාන්දු විසින් සාදන ලද වර්ෂ 1995 ක් වූ ජනවාරි මස 08 වැනි දිනැති අංක 1363 දරන පිඹුරේ ලොට් 6 වශයෙන් දැක්වෙන ජා-ඇල එස්ටේට් යනුවෙන් හඳුන්වන දැනට ද ගිනැන්ස් කොම්පැනි වත්ත යනුවෙන් හඳුන්වන ප්‍රමාණයෙන්, ප්‍රමාණය : පර්. 12 . 7 මාර්ග අයිතිය හා අනෙකුත් අයිතීන් සමග ඉහත කී 1363 දරන පිඹුරේ ලොට් 13 වශයෙන් දැක්වෙන (අඩි 20 පාර සඳහා වෙන් කිරීම) ප්‍රමාණය : පර්. 38.2

ඉහත කී 1363 පිඹුරේ ලොට් 27 වශයෙන් දැක්වෙන (අඩි 15 පාර සඳහා වෙන් කිරීම) ප්‍රමාණය : පර්. 7.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සී. පී. ආර්. රණසිංහ විසින් සහතික කරන ලද්දාවූ ද, වර්ෂ 2003 ක් වූ දෙසැම්බර් මස 31 වැනි දිනැති අංක 3655 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, වත්තල, අබිලා මාර්කටින් සර්විසස් හි තනි අයිතිකරු වන නාගරාජා සත්කුමාර් නීති රාජා යන අය පැහැරහැර ඇති හෙයින් සීමාසහිත නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් අප වෙත පවරා ඇති බලය ප්‍රකාරව 2007ක් වූ ජූනි මස 28 වැනි දින පෙ. ව. 10.00 ට ඉහත සඳහන් දේපළ අප විසින් එම ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2007.01.26 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* ද 2007.01.10 වැනි දින දිවයින, ද අයිලන්ඩ් සහ තිනකුරල් පුවත්පත් ද බලන්න.

*දේපළට පිවිසීම.*– කොළඹ සිට මීගමුව පාරේ කිලෝමීටර් 19.8ක් වැලිගම්පිටිය හංදිය දෙසට ගමන් කර දකුණට ඇති උසාවි පාරට හැරී තවත් කිලෝමීටර් 0.4ක් පමණ ගමන් කරන්න. එතැනින් කන්දවත්ත පාරට හැරී කිලෝමීටර් 0.2 ගමන් කර වමට ඇති අඩි 20 පළල පාරට හැරී යාර 110 පමණ ගමන් කළ විට අදාළ දේපළ දකුණු පසින් පිහිටා ඇත.

*ගෙවීම් කළයුතු ආකාරය.*–විකිණීම ස්ථිරකළ වහාම සාර්ථක ගැණුම්කරු විසින් මිටිය පහත හෙලූ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතුය :

01. ගැනුම් මිලෙන් සියයට දහයක් (10%)ක්,
02. ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව 90% විකිණීමේ දින සිට දින 30ක් තුළ දී සීමාසහිත නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතුය,
03. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
04. වෙන්දේසිකරුගේ වෘත්තීය ගාස්තු තීන්දු වූ මිලෙන් සියයට දෙකයි දශම පහක් (2.5%),
05. බැංකුව විසින් දරන ලද සියලුම ප්‍රචාරන සහ අනෙකුත් වියදම්,
06. ලිපිකරු හා සෝෂක වේතන රු. 500යි,
07. නොතාරිස් ගාස්තු විකිණුම් කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000යි.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න. කළමණාකරු නීති, සීමාසහිත නේෂන්ස් ට්‍රස්ට් බැංකුව, අංක 242, යූනියන් පෙදෙස, කොළඹ 02. දුරකථන අංක 011-4313131.

ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවෝ,
බලයලත් වෙන්දේසිකරුවෝ,
තක්සේරුකරුවෝ සහ උසාවි කොමසාරිස්වරු.

කොළඹ වාණිජ මහාධිකරණය සහ දිසා අධිකරණය,
බලයලත් වෙන්දේසිකරුවෝ රාජ්‍ය සහ වාණිජ බැංකු,
අංක 182, පළමු මහල, හල්ස්ඩ්‍රෝප් පාර, කොළඹ 12,
දුරකථන/ෆැක්ස් අංකය : 011-2388318.

06-119

## මහජන බැංකුව - කුරුණෑගල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩවිල්ලි හත්පත්තුවේ තිරගන්දහය කෝරළේ, බෙල්ගොඩ එස්ටේට් *හෙවත්* බෙන්මන්ට් ගෘප් නමැති ඉඩමට සාදන ලද අංක 2377 සහ 1997.09.05 දිනැති පිඹුරේ ලොට් 02 දරන විශාලත්වය අක්කර තුනයි, රූඩ් එකයි, පර්චස් හතයි දශම පහ (අ. 3, රූ. 01, පර්. 7.5) ක් විශාල වූ ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පලතුරු ගොඩනැගිලි ආදී සෑම සියලු දේ ද සමග මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ 2007.06.22 දින පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2002.05.31 දින ද, දිනමිණ පුවත්පතේ 2004.12.14 දින දී ද, ඩේලිනිව්ස් පුවත්පතේ 2004.12.03 දින දී ද, තිනකරන් පුවත්පතේ 2004.12.14 දින දී ද, පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.–* කුරුණෑගල කොළඹ පාරේ දම්බොක්ක හංදිය දක්වා ගොස් කටුපිටිය හරහා රඹුක්කන පාරේ 3/1 පාලම ළඟ කොස්ගොල්ල හංදියේ බෝගහ අසලින් වමට ඇති මාවතගම පාරේ කි. මී. 3ක් පමණ ගිය පසු බෙල්ගොඩ එස්ටේට් ලඟින් දකුණට ඇති ගුරු පාරේ පහළට ගොස් විශාල වංගුව ළඟින් මීටර් 300ක් ගොස් කෙලින් වමට ඇති නඩත්තු නොකළ පාරේ ගිය විට මෙම ඉඩම හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.–* වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදල් ගෙවිය යුතුය :

01. ගැණුම් මිලෙන් 10%ක්,
02. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
03. වෙන්දේසියේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
04. ලිපිකරු හා නිවේදන ගාස්තු වශයෙන් රු. 500ක්,
05. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
06. විකුණුම් සහතික සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මහජන බැංකුව - කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකරු වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක : 037-2222453, ෆැක්ස් අංකය: 037-2222338.

හිමිකම් හා වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඩබ්ලිව්. එම්. අයි. ගල්ලෑල්ල (සාමවිනිසුරු),
උසාවි කොමසාරිස්, බලයලත්
වෙන්දේසිකරු සහ තක්සේරුකරු.

අංක 28, නව නීතිඥ සහ වෙළඳ සංකීර්ණය,
කුමාරතුංග මාවත,
කුරුණෑගල.

06-99

## ලංකා බැංකුව

### ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය යොමු අංකය : 154/02.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2007.01.19 දිනැති අංක 1481 දරන *ගැසට් පත්‍රයේ* හා 2007. 01.16 දිනැති ඩේලිනිව්ස්, දිනමිණ හා තිනකරන් යන පුවත්පත්වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගත හැකි මුල් මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළිය ද, ගාස්තු හා මුදල් ද අයකරගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍ර පිහිටි ස්ථානයේදී ම 2007.08.08 වැනි දින පෙ. ව. 10.30 ට කුලියාපිටිය පන්නල පාර, අංක 56 හි පදිංචි ජේ. ඇල්පියස් පෙරේරා මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

#### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩවිල්ලිහත්පත්තුවේ, තිරගන්දහය කෝරළේ, වැහැර ග්‍රාමයේ කොළඹ පාරේ පිහිටි වරිපනම් අංක 107 වශයෙන් දැන් වරිපනම් අංක 229 දරන බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල, උතුරට : එච්. එල්. ගුණදාස හිමිකම් කියන ඉඩම ද ; නැගෙනහිරට : පුංචිසිංඤෝ හිමිකම් කියන ඉඩම ද ; දකුණට : ලුසිනෝනා හිමිකම් කියන ඉඩම ද ; බස්නාහිරට : කොළඹ පාර ද, මායිම්ව දිග අඩි දාහතක් ද (17) පළල අඩි පනස් හතරක් (54) ද, ප්‍රමාණයෙන් යුත් ඉඩම සමග එහි පිහිටි ගහකොළ වැවිලි සහ සියලු දේ වේ. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 1474/36 හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම මෑත මිණුම් පිඹුරකට අනුව දැන් පහත සඳහන් පරිදි විස්තර ඇත. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩවිල්ලි හත්පත්තුවේ, තිරගන්දහය කෝරළේ වැහැර ග්‍රාමයේ කොළඹ පාරේ පිහිටි වරිපනම් අංක 229 දරන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එස්. එම්. එම්. පාදෙනිය විසින් සාදන ලද 2001.12.11 දිනැති අංක 628 දරන පිඹුරේ ලොට් අංක 1 වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ සහ මෑත දී කරන ලද මිණුම් පිඹුර අනුව "වරිපනම් අංක 229 " නමැති ඉඩම වශයෙන් විස්තර කර ඇති ඉඩම, එකී අංක 628 දරන පිඹුර අනුව උතුරට : කොළඹ කුරුණෑගල මහා මාර්ගය ද ; නැගෙනහිරට : ඩබ්. ඒ. එම්. විජේසිංහ හිමිකම් කියන වරිපනම් අංක 225 ද ; දකුණට : ඩී. ටී. එච්. ඩැනී හිමිකම් කියන වරිපනම් අංක 237 ද, බස්නාහිරට : ආර්. එස්. ගුණසේකර හිමිකම් කියන වරිපනම් අංක 231 ද මායිම්ව පර්චස් දෙකයි දශම එකයි බිංදුවක (පර්. 02.10) ප්‍රමාණයෙන් යුත් ඉඩම සමග එහි පිහිටි ගහ කොළ වැවිලි ගොඩනැගිලි සහ සියලු දේ වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඊ. ජී. ජයවීර,
කළමනාකරු.

ලංකා බැංකුව,
2 වැනි නගර කාර්යාලය,
කුරුණෑගල.

06-106

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2007.03.23 දිනැති අංක 1490 දරන *ගැසට් පත්‍රයේ* හා 2007.03.14 දිනැති දිනමිණ, තිනකරන් සහ 2007.03.14 දිනැති ඩේලිනිව්ස් යන පුවත්පත්වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගත හැකි මුල් මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍ර පිහිටි ස්ථානයේදී ම 2007.06.27 වැනි දින පෙ. ව. 11.00 ට අංක 290, හැව්ලොක් පාර, කොළඹ 05, පදිංචි වෙන්දේසිකාර තවීන්ද්‍ර සමරවික්‍රම මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

#### දේපළ පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, අදිකාරිපත්තුවේ මුල්ලේරියාව කොටිකාවත්ත ප්‍රාදේශීය සභා සීමාවේ මුල්ලේරියාව හි පිහිටි දෙල්ගහවත්ත නමැති ඉඩම බලයලත් මිනින්දෝරු අනිල් නවගමුව විසින් සාදන ලද 2004 මැයි මස 12 දිනැති අංක 1860 දරන පිඹුරේ ලොට් 2 වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල, උතුරට : මල්ලිකා ජයලත්ගේ ඉඩම සහ එකී අංක 1860 දරන පිඹුරේ එම ඉඩමේ ලොට් 1 සහ 2 ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු සාලිය වික්‍රමසිංහ විසින් සාදන ලද අංක 238 දරන පිඹුරේ ලොට් ඒ සහ ඊ ද, දකුණට : බලයලත් මිනින්දෝරු සාලිය වික්‍රමසිංහ විසින් සාදන ලද අංක 238 දරන පිඹුරේ ලොට් ඒ සහ ඊ ද, දකුණට : බලයලත් මිනින්දෝරු සාලිය වික්‍රමසිංහ විසින් සාදන ලද එකී අංක 238 දරන පිඹුරේ ලොට් ඊ සහ කේ. ජයසේනගේ ඉඩම ද, බස්නාහිරට : කේ. ජයසේනගේ ඉඩම සහ මල්ලිකා ජයලත් සහ අනෙක් අයගේ ඉඩම ද, මායිම්ව එකී අංක 1860 දරන පිඹුර අනුව පර්චස් පහළොවක් (අ. 0 රූ. 0 පර්. 15) හෝ හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි තුනයි හතයි නවයක (හෙක්. 0.0379) බිම් ප්‍රමාණය සමග එහි පිහිටි ගොඩනැගිල්ල සහ සියලු දේ වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල් 104/182 හි ලියාපදිංචි කර ඇත.

තවද, ඉඩම මත පාරේ අයිතිය ද වේ.

මුල්ලේරියාව හි පිහිටි දෙල්ගහවත්ත නමැති ඉඩම එකී අක 1860 දරන පිඹුරේ ලොට් 3 වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ සහ නිශ්චිත ඉඩම් කැබැල්ල, උතුරට : අංගොඩ සිට සල්මල් උයනට පාර ද, නැගෙනහිරට: බලයලත් මිනින්දෝරු සාලිය වික්‍රමසිංහ විසින් සාදන ලද අංක 238 දරන පිඹුරේ ලොට් ඒ ද, දකුණට : ලොට් 2 ද, බස්නාහිරට : ලොට් 1 ද මායිම්ව එකී අංක 1860 දරන පිඹුර අනුව පර්චස් අටයි දශම දෙකක (පර්. 8.2) හෝ බිංදුවයි දශම දෙකයි බිංදුවයි හතක (හෙක්. 0.0207) ප්‍රමාණයෙන් යුත් ඉඩම සමග එහි පිහිටි ගොඩනැගිලි සහ පිහිටි සියලු දේ වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල් 104/183 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එම්. එස්. එම්. නිශාම්ඩීන්,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු.

ලංකා බැංකුව,
මිලාගිරිය අධිශ්‍රේණිය ශාඛාව.

06-105

## මහජන බැංකුව - දෙල්ගොඩ ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මහර ප්‍රාදේශීය සභාවේ අංක 2 නාරංවල උප කාර්යාල සීමාවේ කිරිල්ලවල හි පදිංචිය සඳහා සුදුසු පරිසරයක පිහිටි පර්චස් විසිපහයි දශම හතයි පහ (පර්. 25.75) ක ඉඩම මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින්, 2007.06.22 වැනි දින පෙ. ව. 11.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ දේපළ පිහිටි ස්ථානයේ දී විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2003.10.24 දින ද, ඩේලිනිව්ස්, දිනමිණ, සහ තිනකරන් පුවත්පත්වල 2004.02.27 දින ද, පළ කර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.*– දෙල්ගොඩ සිට බැලුම්මහර හන්දිය දක්වා පැමිණ එතැනින් කොළඹ නුවර පාරේ කොළඹ දෙසට ගියවිට කිරිල්ලවල ඉදිගහමුල හන්දියේ පිහිටි ඉන්ධන ගබඩාව ඉදිරිපිට කොළඹ –නුවර පාරට මුහුණ ලා පාරේ දකුණු පසට මායිම්ව මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය :

1. ගැණුම් මිලෙන් 10%ක් ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත, මුදුන්ගොඩ, බැලුම්මහර, නුවර පාර, අංක 131, මහජන බැංකුව, බටහිර කලාප III කාර්යාලයේ සහකාර සාමාන්‍යාධිකාරී වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක : 033-2222325, 033-2225008, 033-2226741,
ෆැක්ස් අංකය : 033-2226165.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10%ක මුදල ආපසු

නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ෂොක්මන් සහ සමරවික්‍රම,
ISO 9001 : 2000 සහතිකයලත්, ශ්‍රී ලංකාවේ
පිළිගත් පුරෝගාමී වරලත් වෙන්දේසිකරුවෝ,
තක්සේරුකරුවෝ සහ දේපළ ඒජන්තවරු.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර,
දුරකථන අංකය : 081-2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නාගරික කාර්යාලය සහ වෙන්දේසි ශාලාව :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05,
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011-2588176
ඊමේල් : schokman@samera1892.com.

06-75

---

## සීමාසහිත සෙලාන් බැංකුව– කුරුණෑගල ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 4 වන වගන්තිය යටතේ විකිණීම

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, තිරගන්සහේ කෝරළේ කොළඹ විල්ලිහත්පත්තුවේ විල්ගොඩ පිහිටි බලයලත් මිනින්දෝරු පී. බී. දිසානායක විසින් සාදන ලද 1990.01.03 දිනැති අංක 654 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන විල්ගොඩ එස්ටේට් නමැති ඉඩමේ කැබලි අංක 2 ලකුණු කළ බෙදා වෙන්කරන ලද ඉඩම් කොටස, ප්‍රමාණයෙන් පර්චස් විසි දෙකක් (අ. 0 රූ. 0 පර්. 22) විශාල ගස්, වගා සහ එහි පිහිටි නිවාස ගොඩනැගිලි සමග ඉඩම. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් ඒ 1186/198 යටතේ ලියාපදිංචි කර ඇත.

මෙම දේපළ කුරුණෑගල පදිංචි හිටිහාමිලාගේ කපිලසිරි හේරත් යන බන්ධනදායි වශයෙන් සීමාසහිත සෙලාන් බැංකුව වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

ඉහත සඳහන් දේපළ 2007 ජුනි මස 26 වැනි දින පෙ. ව. 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුති දැන්වීම *රජයේ ගැසට් පත්‍රයේ* 2006.03.24 දින ද, ලංකාදීප සහ ඩේලිමිරර් යන පුවත්පත්වල 2006.01.30 වැනි දින ද, වීරකේසරී පුවත්පතේ 2006.08.17 දින ද පළ වී ඇත.

*දේපළට පිවිසීම.*– මීගමුව මාර්ගයේ ගමන්කර පුවක්ගස් හංදිය දක්වා ගොස් (සැතපුම් 1/2ක්) ඉදිරියට යන විට දකුණුපසට ඇති විල්ගොඩ පාරට හැරී නිශ්ශංකපුර හංදිය දක්වා (සැතපුම් 3/4ක්) ගිය විට හමුවන නිවාස සංකීර්ණ පාරේ (නිශ්ශංකපුර) සැතපුම් 1/4ක් පමණ ඉදිරියට ගිය විට මාර්ගයේ වම් පස අදාල දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*– සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය : (1) ගැණුම් මිළෙන් 10%ක් (සියයට දහයක්), (2) පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිළෙන් 1%ක් වන පළාත් අධිකාරී බද්ද (සියයට එකක්), (3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), (4) නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, (5) ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, (6) සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිළෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30ක් ඇතුලත සීමාසහිත සෙලාන් බැංකුවට ගෙවා නිම කළ යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති), සීමාසහිත සෙලාන් බැංකුව, අංක 90, ගාලු පාර, කොළඹ 03.
දුරකථන අංක: 011-2456258, 2456263, 2456284.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු.

ටී. ඇන් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත,
කොළොන්නාව.
දුරකථන අංක : 011-2696155, 011-2572940

06-87

---

## සීමාසහිත සම්පත් බැංකුව

### 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 9 වන වගන්තිය යටතේ විකුණුම් නිවේදනය

ඩෝරන් මේන්ටනන්ස් සර්විසස් - ගිණුම් අංක : 0007 1001 1478

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2003.01.30 වැනි දින යෝජනා කොට සම්මත කරගනු ලැබ 2003.09.05 වැනි දින රජයේ *ගැසට්* පත්‍රයේ ද 2003.07.31 වැනි දින දිනමිණ ඩේලිනිව්ස් සහ තිනකරන් යන දිනපතා පුවත්පත්වලද පළ කරන ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් අටලක්ෂ විසිපන්දහස් අටසිය දහනවයයි ශත හැට නවයක (රු. 8,25,819.69) මුදල සමග තවත් රුපියල් හත් ලක්ෂ අනූදහස් හයසිය තිස්දෙකයි ශත හතලිස් පහක (රු. 7,90,632.45) මුදල සඳහා වසරකට සියයට විසිතුන (23%) බැගින් 2002 නොවැම්බර් මස 01 වැනිදා සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොලී මුදල ද සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවා ද සමග, එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් 2007.06.18 දින පෙ. ව. 11.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

## උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර උඩගම්පහ කෝරළේ නත්තරම්පොත පිහිටි පඩිවත්ත සහ කහවත්ත එස්ටේට් (බලයලත් මිනින්දෝරු එස්. එම්. තල්වත්ත විසින් සාදන ලද 1963 ජනවාරි මස 21 දාතම හා අංක 1235 දරන පිඹුරේ ලොට් 4 ඩී 2 වශයෙන් සහ 1962 ඔක්තෝබර් මස 28 දාතම හා අංක 1194 දරන පිඹුරේ ලොට් 4 ඊ වශයෙන් ද, ලකුණු කොට ඇති) නමැති ඉඩමේ කොටසකින්, බලයලත් මිනින්දෝරු ජී. ආර්. ඩබ්ලිව්. එම්. වීරකෝන් විසින් සාදන ලද 1985 නොවැම්බර් මස 26 දාතම දරන උප බෙදුමක් වන බලයලත් මිනින්දෝරු බී. එම්. එස්. බී. කරුණාරත්න විසින් සාදන ලද 1984 ජූලි 15 දාතම හා අංක 783 දරන පිඹුරේ නිරූපිත ලොට් 3 ඒ වශයෙන් ලකුණු කොට දක්වා ඇති මහනුවර ඉඩම් කාර්යාලයේ වෙලුම/පත්‍රිරුව ඊ 701/109 හි ලියාපදිංචි කොට ඇති, ප්‍රමාණයෙන් පර්චස් පහළොවයි දශම පහක් (අක්. 0 රූඩ් 0 පර්. 15.5) වන උතුරට එම පිඹුරේ ම ලොට් අංක 02 හා මාර්ගය ද නැගෙනහිරට එකී පිඹුරේ නිරූපිත අරංගල සිට නත්තරම්පොත දක්වා දිවෙන මාර්ගය ද, දකුණට එකී පිඹුරේ නිරූපිත අරංගල සිට නත්තරම්පොත දක්වා දිවෙන මාර්ගය සහ ලොට් 3 බී ද සහ බටහිරට එකී පිඹුරේ නිරූපිත ඇළ මාර්ගය හා ලොට් 3 බී වශයෙන් ලකුණු කොට ඇති කොටස ද සහ එම වත්තේ ම ඉතිරි කොටස ද මායිම් වන බෙදා වෙන්කොට සීමා නිර්ණය කළ බිම් කොටසය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

06-76

---

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව – අම්බලන්ගොඩ ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් ජී. ඩේවිඩ් විසින් සහතික කරන ලද්දාවූ ද, සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමට ලියන ලද්දාවූ ද, 2000.04.11 වැනි දින සහ අංක 1792 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම දොන් මොහාන් අජන්ත උඩලමත්ත ගමගේ ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, සීමාසහිත හැටන් නැෂනල් බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2007 ජූනි මස 19 වැනි දින පෙ. ව.11.00 ට ඇරඹෙන පරිදි දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල බෙන්තොට වලල්ලාවිට කෝරළේ, නවදගල පිහිටි "කන්ද අද්දරවත්ත " නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක ඩී. ඊ. මහවිතාන විසින් 1960ක් වූ ජූලි මස 17 වැනි දින මැන සාදන ලද අංක 772 ඒ දරන පිඹුරෙන් සහ බලපිටිය අධිකරණ නඩු අංක එන්. පී. 962 හි ද සඳහන් පිඹුරෙන් බෙදා වෙන්කරන ලද ලොට් 1 දරන ඉඩම් කොටස විශාලත්වය රූඩ් 02යි පර්චස් 3.5.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2007.02.15 දින රජයේ *ගැසට් පත්‍රය* හා 2007.02.27 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය :

1. ගැණුම් මුදලින් සියයට දහයක් (10%) ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහක් (2.5%) ද,
4. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සියයක් (රු. 500) ද,
5. සියලුම ප්‍රචාරක වියදම්,
6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2,000) ද වේ.

ගැණුම් මිළෙන් ඉතිරි 90% ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුලත සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතුය. දින 30ක් ඇතුලත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති 10%ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු හා අදාල ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු, කළමණාකරු, සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10, දුරකථන අංක 2661815, 2661816 මගින් ලබාගත හැක.

එන්. එච්. පී. එෆ්. ආරියරත්න,
උසාවි කොමසාරිස් හා බලයලත් වෙන්දේසිකරු.

අංක 34/31 සහ 32, නීතිඥ කාර්යාල සංකීර්ණය,
කොළඹ 12.

06-41

---

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව –හැටන් ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඩී. එන්. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද්දාවූ ද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියා සහතික කරන ලද්දාවූ 1993.03.26 දින සහ අංක 127 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සෙල්ලයියා ඥාණසේකරන් සහ වයිමන් ඉනෝකා ෆොන්ස්ටිනා යන අයවලුන් ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින්, සීමාසහිත හැටන් නැෂනල් බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර පහත

සඳහන් දේපළ පිහිටි ස්ථානයේ දී 2007 ජුනි මස 22 වැනි දින පෙ. ව. 11.00 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ කඳාන නගර සභා සීමාව තුළ, කඳානේ පිහිටි බෝගහතොටුපල පාරේ, වරිපනම් අංක 63/11 දරන "කෝන්ගහවත්ත" නමැති ඉඩමෙන් බෙදා වෙන්කරනු ලැබූ බලයලත් මානක එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් සාදනු ලැබූ අංක 4757 සහ 1978 ඔක්තෝබර් මස 28 වැනි දිනැති පිඹුරෙහි අංක 2 දරන කැබැල්ල සහ අඩි 6ක් පළල පාරක් සඳහා වෙන් කරනු ලැබූ අංක 06 දරන කැබැල්ල මතින් හා ඒ දිගට මාර්ග අයිතිය ද සමග වේ.

විශාලත්වය : පර්චස් 9.80

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2003.10.10 දින *රජයේ ගැසට් පත්‍රය* සහ 2003.11.24 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය :

1. ගැණුම් මුදලින් සියයට දහයක් (10%) ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහක් (2.5%) ද,
4. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සියයක් (රු. 500)' ද,
5. සියලුම ප්‍රචාරක වියදම්,
6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2,000) ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුලත සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතුය. දින 30ක් ඇතුලත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති 10%ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු හා අදාල ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, හැටන් ශාඛාව (දුරකථන අංක 051-2222555) හෝ කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 479 ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන කළමනාකරු (ණය අයකිරීම්) දුරකථන අංක : 2661815, 2661816 මගින් ලබාගත හැක.

එන්. එච්. පී. එෆ්. ආරියරත්න,
උසාවි කොමසාරිස් හා බලයලත් වෙන්දේසිකරු.

අංක 34/31 සහ 32,
නීතිඥ කාර්යාල සංකීර්ණය,
කොළඹ 12.

06-40

## මහජන බැංකුව - මූලස්ථාන ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

### පදිංචියට සුදුසු නිවාසමය දේපලක්

මත්තේගොඩ ගම පිහිටි මත්තේගොඩ වත්ත නමැති ඉඩමෙන් පර්චස් විසි එකයි දශම හයයි හයක් විශාල ඉඩම සහ නිවස (අ. 0 රූ. 0 පර්. 21.66) මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2007.06.15 වැනි දින පෙ. ව. 11.30ට ප්‍රසිද්ධ වෙන්දේසියේ පිහිටි ස්ථානයේ දී විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2007.04.12 වැනි දින ද, ඩේලිනිව්ස්, දිනමිණ සහ තිනකරන් පුවත්පත්වල 2007.04.03 වැනි දින ද, පළ කර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.*– කොළඹ සිට කොට්ටාව නගරයට ගොස් එතැනින් දකුණට ඇති පාරේ කි. මී. 2ක් පමණ ගිය විට මත්තේගොඩ නිවාස යෝජනා ක්‍රමය හමුවේ. එම නිවාස යෝජනා ක්‍රමය බස් නැවතුම්පළ පසුකර මීටර් 100ක් පමණ ඉදිරියට යන විට දකුණුපසට ඊගල් නිවාස පාර හමුවේ. එම පාරේ දකුණු පස 2 වැනි නිවස වේ.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය :

1. ගැණුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරිගේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වෙතොත් එම මුදල,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු වශයෙන් රු. 500ක්,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිළෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත කොළඹ 01, ආදීපාද වීදියේ, මහජන බැංකුවේ, සහකාර සාමාන්‍යාධිකාරී (බටහිර කලාපය 1) වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක: 2393678, 2387068, ෆැක්ස් අංකය : 2435977.

හිමිකම් සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
ප්‍රසිද්ධ වෙන්දේසිකරු සහ තක්සේරුකරු.
මුළු දිවයිනටම සාමවිනිසුරු.

අංක 11/55, කුඩාබුත්ගමුව, අංගොඩ.
කාර්යාල දුරකථන අංකය : 011-5756356
නිවස : 011-2419126

06-89

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

### දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන සංශෝධිත ගාස්තු

1995 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ.)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළකරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. කාර්යාල වේලාවන් පෙරවරු 9.00 සිට පස්වරු 4.45 දක්වා වේ.

4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.30 සිට පස්වරු 3.30 දක්වා බව සැලකිය යුතුයි.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති තැනට එවිය යුතුය.

6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ටයිප් ගසා එවිය යුතුයි. අත් අකුරින් යුතු කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතෙකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1995 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේයි :-

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | 51 | 0 |
| වැඩිවන සෑම අඟලකටම හෝ ඉන් කොටසකටම | 51 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | 504 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | 1,008 | 0 |

(අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)

11. සෑම සිකුරාදා දිනයකම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. සෑම මාසයකම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 1995.01.01 දින සිට සංශෝධිත දායක ගාස්තුව* :-

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* - (වාර්ෂික)

| | මෙරට රු. | ශ. | පිටරට රු. | ශ. |
|---|---|---|---|---|
| I වන කොටස සම්පූර්ණයෙන් (I, II, III ඡේද තුනම ඇතුළත්) | 1,612 | 0 | 2,098 | 0 |
| II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 572 | 0 | 745 | 0 |
| I වන ඡේදය | 520 | 0 | 1,007 | 0 |
| II වන ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර්, විභාග ආදිය) | 624 | 0 | 1,009 | 0 |
| III වන ඡේදය | 468 | 0 | 907 | 0 |
| අති විශේෂ ගැසට් පත්‍රය | 3,360 | 0 | 4,422 | 0 |

ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ 12 මාසයකට නොඅඩු කාලසීමාවකට පමණය.

*තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | | මිළ රු. | ශ. | තැපැල් ගාස්තුව (මෙරට) රු. | ශ. |
|---|---|---|---|---|---|
| (අ) | I වන කොටස | 31 | 0 | 5 | 0 |
| | II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 11 | 0 | 5 | 0 |
| (ආ) | I වන ඡේදය | 10 | 0 | 5 | 0 |
| | II වන ඡේදය | 12 | 0 | 5 | 0 |
| | III වන ඡේදය | 9 | 0 | 5 | 0 |

* දායක මුදල් භාරගැනීම සහ තනිපිටපත් විකිණීම භාර කොළඹ 01 ලෝටස් පාර, අංක 32හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියළු දෙනාගේම පහසුවටද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ 01, ලෝටස් පාර, අංක 32හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

*සැළකිය යුතුයි.*- මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළකිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2007** | | | |
| ජූනි | 2007.06.01 | සිකුරාදා | 2007.05.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.06.08 | සිකුරාදා | 2007.05.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.06.15 | සිකුරාදා | 2007.06.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.06.22 | සිකුරාදා | 2007.06.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.06.29 | සිකුරාදා | 2007.06.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූලි | 2007.07.06 | සිකුරාදා | 2007.06.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.07.13 | සිකුරාදා | 2007.06.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.07.20 | සිකුරාදා | 2007.07.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.07.27 | සිකුරාදා | 2007.07.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| අගෝස්තු | 2007.08.03 | සිකුරාදා | 2007.07.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.08.10 | සිකුරාදා | 2007.07.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.08.17 | සිකුරාදා | 2007.08.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.08.24 | සිකුරාදා | 2007.0810 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.08.31 | සිකුරාදා | 2007.08.17 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.